# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 805/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 13/05/2024<br>පැය 1050 |

## මාධ්‍ය නිවේදනය

**01. නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇහැලියගොඩ පොලිස් ස්ථානය.**

2024.05.12 වන දින සවස් කාලයේ ඇහැලියගොඩ පොලිස් වසමේ මූනංගල වත්තේදී හා පරකඩුව කොට්ටුන්න ප්‍රදේශයේදී ඇහැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීම් දෙකක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 2111 ක් (බැරල් 12)) සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 42 හා 48 වයස්වල පසුවන ඇහැලියගොඩ හා පරකඩුව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ඇහැලියගොඩ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දොම්පේ පොලිස් ස්ථානය.**

2024.05.12 වන දින සවස් කාලයේ දොම්පේ පොලිස් වසමේ උඩමාපිටිගම ප්‍රදේශයේදී දොම්පේ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 1080 ක් (බැරල් 06) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වන උඩමාපිටිගම, දොම්පේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දොම්පේ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - යක්කල පොලිස් වසම.**

2024.05.12 වන දින රාත්‍රී කාලයේ යක්කල පොලිස් වසමේ කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ ඉඹුල්ගොඩ ප්‍රදේශයේදී නුවර දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ කාර් රථයක් රියදුරුට නින්දයාම හේතුවෙන් මාර්ගයෙන් ඉවතට පැන මාර්ගයේ මැද

දූපතේ පිහිටි විදුලි කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් කාර් රථයේ රියදුරු ඇතුළු හා එහි ගමන් ගත් කාන්තාවන් තිදෙනෙකු තුවාල ලබා ගම්පහ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එක් කාන්තාවක් මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 41 ක් වන පැලැන්වත්ත, පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීර ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර තුවාල ලැබූ අනෙක් තිදෙනාම ගම්පහ රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි. යක්කල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**